## 13 ශ්‍රේණිය - ආර්ථික විද්‍යාව -6 වන සතිය - ජූනි 8 සිට 12 දක්වා

## 9.4 ගෝලීයකරණය, කලාපීකරණය හා ද්විපාර්ශවීය වෙළෙඳ ගිවිසුම් විමසයි.

➢ ලෝක වෙළෙඳ සංවිධානය :-

බහු පාර්ශවීය වෙළෙඳාමේ ප්‍රවර්ධනයටත්, වෙළෙඳාමේ සුමටව හා ක්‍රමවත්ව පවත්වාගෙන යාමටත් වෙළෙඳාම හා තීරු බදු පිළිබඳ පොදු සම්මුතිය වඩාත් ශක්තිමත් කරමින් 1995 දී පිහිටුවා ගත් ලැබූ ජාත්‍යන්තර සංවිධානයකි.

මෙහි අරමුණු :-

- ❖ බහු පාර්ශවීය වෙළෙඳාම ප්‍රවර්ධනය කිරීම.
- ❖ වෙළෙඳ බාධක අවම කිරීම.
- ❖ වෙළෙඳ නීති සංශෝධනය කරමින් ජාත්‍යන්තර වෙළෙඳ ක්‍රමය තුළ ප්‍රතිසංස්කරණ ඇති කිරීම.

➢ ආර්ථික ගෝලීයකරණය :-

ලෝකයේ රටවල් වෙළෙඳ, ප්‍රාග්ධන, මූල්‍ය, තාක්ෂණ, ප්‍රතිපත්ති යනාදී විවිධ ප්‍රවාහයන් ඔස්සේ එකිනෙකට ඒකාබද්ධ වීමේ ක්‍රියාවලිය ආර්ථික ගෝලීයකරණය වේ. මේ නිසා ලෝක ආර්ථිකයේ අන්‍යෝන්‍ය රැඳියාව, මූල්‍ය ප්‍රවාහයන්ගේ වර්ධනය, නිෂ්පාදන ක්‍රියාවලිය ජාත්‍යන්තරකරණය හා ශ්‍රම සංචලනය තීව්‍ර වේ.

ගෝලීයකරණයට පක්ෂව ඇති තර්ක :-

- ❖ ලෝකයේ වෙළෙඳ පරිමාව ඉහළ යෑම.
- ❖ ආර්ථික වෘද්ධි උපාය මාර්ගයක් ලෙස භාවිතා කළ හැකි වීම.
- ❖ විදේශ ආයෝජනය ඉහළ යෑම.
- ❖ විදේශ දේවා නියුක්තිය ඉහළ යෑම.
- ❖ විදේශ මුදල් ප්‍රේෂණ ඇතැම් රටවල ප්‍රධාන විනිමය ප්‍රවාහයක් වීම.
- ❖ අන්තර්ජාලය ඔස්සේ තොරතුරු ලබාගත හැකි වීම.

ගෝලීයකරණයට විපක්ෂව ඇති තර්ක :-

- ❖ ගෝලීයකරණයේ ප්‍රතිලාභ ලෝකවාසී සියලුදෙනාටම සාධාරණව බෙදී නොයාම.
- ❖ ගෝලීය ආර්ථික අර්බුද අනෙකුත් රටවලට පහසුවෙන් ව්‍යාප්ත වීම.
- ❖ සංස්කෘතිය විනාශ වීම හා සෞඛ්‍ය ගැටලු ඇති වීම.
- ❖ දේශීය කර්මාන්ත බිඳ වැටීම හා රැකියා අහිමි වීම.

➢ ආර්ථික ඒකාබද්ධ වීම් :-

රටවල් ආර්ථික වශයෙන් එක්ව කටයුතු කිරීම සඳහා සංවිධානය වීම ආර්ථික ආර්ථික ඒකාබද්ධ වීම් ලෙස හැඳින්වේ.

මෙහි විවිධ ස්වරූප මෙසේ ය.

1. වරණීය වෙළෙඳ කලාපය.
2. නිදහස් වෙළෙඳ කලාපය.
3. තීරු බදු සංගම්.
4. පොදු වෙළෙඳපොළ.
5. ආර්ථික හා මූල්‍ය සංගම්.
6. පූර්ණ ආර්ථික ඒකාබද්ධ වීම්

අභ්‍යාස

I. ගෝලීය කරගකාරීත්වය තීරණය කරන සාධක පැහැදිලි කරන්න.
II. රටක් ගෝලීයකරණයට නතුවී ඇත්දැයි හඳුනා ගැනීම සඳහා භාවිතා කල හැකි නිර්ණායක මොනවාද ?
III. ගෝලීයකරණ ක්‍රියාවලියේ ශ්‍රී ලංකාව ප්‍රයෝජන ගැනීමට යාමේදී මුහුන දීමට සිදුවන අභියෝග කවරේද ?

චාන්දනී හේරත්
ර/ විද්‍යාරාජ මහා විද්‍යාලය